# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1270 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2023 திகதி

දිනය
Date — 08/10/2023
පැය 0850

**මාධ්‍ය නිවේදනය**

**මනුෂ්‍ය ඝාතනයකට සූදානම්ව සිටි සැකකරුවන් දෙදෙනෙකු පිස්තෝල අවියක් සමඟ අත්අඩංගුවට - ඇල්පිටිය මූලස්ථාන පොලිස් ස්ථානය.**

2023.10.07 වන දින රාත්‍රී කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ පිටුවල, සමගි මාවත ප්‍රදේශයේදී ඇල්පිටිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත යතුරුපැදියකින් පැමිණ සිටි සැකකරුවන් දෙදෙනෙකු පිස්තෝල අවියක්, එම සජීව පතරොම් 10 ක් ජංගම දුරකථන 03 ක්, ව්‍යාජ අංක තහඩු 02 ක් හා යතුරුපැදියක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 31 වයස් වල පසුවන මීටියාගොඩ, නවගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම එක් සැකකරුවෙකු දැනට යුධ හමුදාවට අනුයුක්තව සේවය කරනු ලබන යුධ හමුදා සෙබලෙකු වන අතර, අනෙක් සැකකරුද යුධ හමුදා සේවයෙන් ඉවත් කරන ලද සෙබලෙකු බවටද දැනට නිරීක්ෂණය වී ඇත. මොවුන් පුද්ගලයෙකු ඝාතනය කිරීම සඳහා සූදානම්ව ඉහත ස්ථානයට පැමිණ ඇති බවත්, එම පුද්ගලයාගේ නිවස ආසන්නයේ රැඳී සිටින බවටත් ඇල්පිටිය මූලස්ථාන පොලිසියට ලද තොරතුරක් මත ඇල්පිටිය මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා විසින් ක්ෂණිකව ක්‍රියාත්මක වී මෙම අපරාධය වලක්වමින් ඉහත සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත. තවද සේවයේ නියුතු යුධ හමුදා සෙබලා නිවාඩු ලබා පැමිණ සිටින අතරතුර මෙම අපරාධය සිදුකිරීමට පැමිණ ඇති බවටත් මොවුන් තවත් අවස්ථාවක වෙනත් ස්ථානයක මෙවැනි ආකාරයට මනුෂ්‍ය ඝාතනක් සිදුකිරීම සඳහා සැළසුම් කර යම් ප්‍රදේශයකට ගොස් එය අසාර්ථක වී ඇති බවත්, වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත. එසේම මෙම පුද්ගලයා ඝාතනය කිරීමට සැළසුම් කිරීම විදේශගතව සිට මෙහෙයවා ඇති බවට නිරීක්ෂණය වී ඇත.

ඇල්පිටිය මූලස්ථාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**